# ලස්සන මල්



සමනලී අබේසිංහ



# ලස්සන මල්

සමනලී අබේසිංහ

පළමු මුද්‍රණය - 2021

දෙවන මුද්‍රණය - 2025 (සංශෝධන සහිතව)

වෙනත් කෘති

පුංචි සමනලීගේ පළමු ජයග්‍රහණය - 2023

මහාමායා බාලිකා විදුහල

5 ශ්‍රේණිය B

කෘතිය පළ කරන දිනය 2025.02.10

ISBN - 978 - 624 - 97088 - 0 - 8



# පිදුම

කිරි මුහුද අද්දර

වැඩ සිටින දළඳා සමිඳ

ලස්සන මල් මෙලෙස

පළමු කොට පූජා කරමි......

නැණ ගුණින් පොහොසත්ව

දිවි අරණ දිනන්නට

මඟ කියා දෙන ගුරු මව්නි පියවරුනි,

පුදමි මේ පොත නුඹ නමට......

ගුණ සුවඳ වඩවමින්

ලස්සන මලක් වන්නට

දිරි දෙමින් සෙනෙහසින්

මගේ ලොව එළිකරන

අම්මාට,අප්පච්චිට

පුදමි අදරින්

ලස්සන මල් මිටක් ලෙස ......

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණිය යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝදමත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණ ගත්කරණී** "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි

ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලාතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

# මතක

2020 අවුරුද්දේ මහාමායාවේ 1 ශ්‍රේණියට ඇතුළත් වෙන්න ආව මුල්ම දවස අද වගේ මතකයි. එදා අම්මගෙයි, අප්පච්චිගෙයි අතේ එල්ලිලා හරිම සතුටින් මම පාසලට ආවේ.

ඒත් දවස් කිහිපයක් පාසල් එද්දී කොවිඩ් 19 වසංගතය නිසා අපේ පාසල් ගමන නතර වුණා. ඉතිං , ගෙදරට වෙලා මාර්ගගතව ඉගෙන ගන්න කාළේ තමයි මම මගේ පළවෙන් කවි පොත "ලස්සන මල්" කෘතිය රචනා කළේ.

එදා ඒ පොත කියවන්න ලැබුනේ සීමිත පිරිසකට පමණයි. ඒ නිසා ඒ පොත සංශෝධන කිහිපයක් එක්ක අලුත් කවි කිහිපයක් එකතු කරලා මුළු ලෝකයේ ඉන්න සිංහල පාඨකයන්ට රස විදින්න මෙවර හෙරණගත්කරණී වෙනුවෙන් මාර්ගගතව එළිදක්වනවා.

ලස්සන මල් රසවිදින්න ඔබ සැමට ආරාධනා



පාට පාට මල්

පිපිලා උදෑසනම

අවදිවෙලා දත්

කට මුව සෝදාලා

පාසල් යනවා

පාසල් ගොස්

හොඳින් ඉගෙන

සතුටින් එනවා



පුළුන් වාගේ

සුදු හාවා කැරට්

ගෙඩිය කෑවා.....

වතුර ටිකක් බීවා

සතුටින් පැන

පැන ආවා

ළමයි ටිකක් දැක්කා

හාවා පැනලා දිවුවා.....



සමනලයෝ සමනලයෝ

කොහේද යන්නේ

මල් හොයන්නද ............

පැණි බීලා එන්නද ............

ඔයත් එක්ක

මල් හොයන්න

මමත් එන්නද ............

ඉර මාමා

එන්න එන්න

උදේම එන්න

හඳ මාමා

එන්න එන්න

රෑට එන්න

තරු මාමාත්

එන්න එන්න

රෑට එන්න

මේ ඔක්කොම ඉන්න

නිසා අහස ලස්සන...........





මගෙ අම්මා

හරි හොඳයි.....

අම්මා හරිම

ලස්සනයි.....

මම අම්මාට

ආදරෙයි.....

අම්මත් මට

ආදරෙයි.....



මාළුවනේ මාළුවනේ

මොකද කරන්නේ

පීන පීන කොහෙද

ඔයා පාවෙලා යන්නේ

බඩගිනිද බඩගිනිද

කෑම දෙන්නද............

ඔයත් එක්ක පීනන්නට

මමත් එන්නද............



දඟකාරයි හැඩකාරයි
චූටි මල්ලියා
අපේ ගෙදර හිනා මවන
චූටි මල්ලියා

හරි හුරතල් කතා මවයි
චූටි මල්ලියා
ගෙදර ඉන්න දඟමල්ලත්
චූටි මල්ලියා...



හොඳ දරුවකු ලෙස හැදෙන්න
යහගුණ දම් පුරුදු වෙන්න
අම්මා වගේ ආදරයෙන්
කියාදෙන්නේ අත්තම්මයි

පුංචි මාව බලා ගන්නේ
රස ආහාර උයලා දෙන්නේ
කවි ගී පද කියාදෙන්නේ
මගෙ අත්තම්මයි

රෑ අහසේ තරු වැල් ගැන
හෙළ ජාතික විරුවන් ගැන
රස වෑහෙන කතා කිව්වේ
මගෙ අත්තම්මයි...



මුතු ඇටයක් වැනි
සුන්දර ලංකා
නිල්වන් සයුරෙන්
වටවුනු ලංකා

මා ඉපදුනු මේ
පින් බිම ලංකා
රකිමි සදා මා
මව්බිම ලංකා



පුංචි පුංචි මල්
සුවඳ හමන මල්
ලොව හැඩ කළ මල්
පුංචි අපිත් මල්

නැණ නුවණින් වැඩි
ගුණ දහමින් පිරි
හොඳ දරුවන් අපි
ලස්සන මල් වැනි

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකූර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සදහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර  සමනලී අබේසිංහ දියණියනි ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්

ISBN - 978 - 624 - 97088 - 0 - 8